# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2025

**8 ශ්‍රේණිය** | **පුරවැසි අධ්‍යාපනය**

නම/ විභාග අංකයඃ ........................................ කාලය : පැය 2 යි

- **සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතුය.**
- **පළමු ප්‍රශ්නයේ සිට පස්වන ප්‍රශ්නය දක්වා ඇති ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1) බ්‍රිතාන්‍ය පාලන සමයේදී ආරම්භ කළ පොදු සේවාවක් වන්නේ,
   1) අධ්‍යාපනය. 2) ප්‍රවාහනය.
   3) සෞඛ්‍ය. 4) ජල සම්පාදනය.

2) "එකා සැමටත් සැම එකාටත්" යන ආදර්ශ පාඨය අයත් වන්නේ,
   1) ශ්‍රී ලංකා පොලීසිය. 2) ශ්‍රී ලංකා යුධ හමුදාව.
   3) සමූපකාරය. 4) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

3) නිදහස් අධ්‍යාපනය ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් ගෞරවය හිමිවන්නේ,
   1) ඩී. එස්. සේනානායක මහතාටය. 2) සී. ඩබ්.ඩබ්. කන්නන්ගර මහතාටය.
   3) ලලිත් ඇතුළත්මුදලි මහතාටය. 4) ගාමිණී දිසානායක මහතාටය.

4) තර්ජනය කිරීම, බිය ගැන්වීම අයත් නායකත්ව ශෛලිය වන්නේ,
   1) දූෂිත නායකත්ව ශෛලියට. 2) ඒකාධිපති නායකත්ව ශෛලියට.
   3) ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලියට. 4) නාමික නායකත්ව ශෛලියට.

5) ඉන්දියාව තුළ පමණක් භාවිතාවන භාෂා ඇතුළත් පිළිතුර වන්නේ,
   1) මරාටි, උර්දු, තෙළිඟු 2) සැමොන්, කැමරු,චීන.
   3) ඉංග්‍රීසි, කන්නඩ,රොමාන්ෂ්.
   4) ප්‍රංශ, පංජාබි, හවායියන්.

- අංක 06 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.
  ( ශ්‍රී ලංකා පොලීසිය, සුවිදිවි මධ්‍යස්ථාන, හින්දු, යුනෙස්කෝ, කොරල්පර කැඩීම, යුනිසෙෆ්, ක්‍රිස්තියානි )

6) මහා ශිව රාත්‍රී ........................................ ආගමිකයන්ගේ උත්සවයකි.

7) ළමා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින ජාත්‍යන්තර ආයතනයක් ලෙස
   ........................................
   හැඳින්විය හැක.

8) අනතුරු හා ආපදාවලදී ........................................ අපගේ සහායට පැමිණෙයි.

9) සුනාමි නිසා ඇතිවන හානි වර්ධනය වීමට බලපාන මිනිස් ක්‍රියාකාරකමක් ලෙස
   ................................ දැක්විය හැකියි.

10) බෝ නොවන රෝග වැළැක්වීමට ........................................ කටයුතු කරයි.

- අංක 11 සිට 15 දක්වා ඇති ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණද වැරදි නම් (×) ලකුණද වරහන් තුළ යොදන්න.

11) ඇමරිකා එක්සත් ජනපදය බහු සංස්කෘතික සමාජයකි. ( )

12) පිළිකා රෝගය බෝවන රෝගයකට උදාහරණයකි. ( )

13) අවුරුදු 18 සම්පූර්ණ නොකළ අය දරුවන් ලෙස සැළකේ. ( )

14) සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් ස්වෙච්ඡා සංවිධාන මඟින් ක්‍රියාත්මක කරයි. ( )

15) නිර්දේශ කර ඇති පරිදි තනුක නොකිරීමෙන් රසායනික ද්‍රව්‍ය සම්බන්ධ අනතුරු ඇතිවේ. ( )

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 16) මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන අනතුරකි. | වකුගඩු රෝගය |
| 17) සංස්කෘතිය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ අයෙකි. | මනු කියවන්නා |
| 18) 2004 වසරේදී ශ්‍රී ලංකාව මුහුණදුන් ස්වභාවික අනතුරකි. | රිය අනතුරු |
| 19) ලංකා විදුලිබල මණ්ඩල සේවකයෙකි. | E.B. ටයිලර් |
| 20) ගැමියන් අතර "මහලෙඩේ " ලෙස ව්‍යවහාරයේ පවත්නා රෝගයකි. | ඩෙංගු උවදුර |
| | සුනාමි |

( ලකුණු 2×20 =40 )

II කොටස

- පහත ප්‍රශ්න වලින් ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

1)
   i. ඔබ භාවිතා කරන පොදු සේවා 03ක් ලියන්න. (ල.03)
   ii. පොදු සේවාවල ලක්ෂණ 02ක් ලියන්න. (ල.04)
   iii. පොදු සේවා අපට අවශ්‍ය වන්නේ ඇයි? කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

2)
   i. ළමා අයිතිවාසිකම් සම්බන්ධ තේමා 03ක් ලියන්න. (ල.03)
   ii. පවුල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ 02ක් ලියන්න. (ල.04)
   iii. පාසල තුළ ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් මඟින් ඔබට ලබාගත හැකි ප්‍රයෝජන කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

3)
   i. පුද්ගල මනස තුළ ඇතිවන චිත්තවේග 03ක් ලියන්න. (ල.03)
   ii. අයහපත් චිත්තවේග පාලනය කර නොගැනීමෙන් ඇතිවන අහිතකර ප්‍රතිඵල 02ක් ලියන්න. (ල.05)
   iii. අයහපත් චිත්තවේග සමනය කරගැනීමට ඔබට ගතහැකි ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

4)

i. ශ්‍රී ලංකාවේ ආගම් පදනම් කරගෙන ගොඩනැගී ඇති සංස්කෘතීන් 03ක් නම් කරන්න. (ල.03)

ii. බහු සංස්කෘතික සමාජයක දැකිය හැකි ලක්ෂණ 02ක් ලියන්න. (ල.04)

iii. බහු සංස්කෘත සමාජයක සාමූහිකව සමගියෙන් කටයුතු කිරීමෙන් අත්වන වාසි කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

5)

i. ස්වභාවික විපත් 03ක් නම් කරන්න. (ල.03)

ii. රසායනික ද්‍රව්‍ය භාවිතවේදී අනතුරු සිදුවිය හැකි ආකාර 02ක් ලියන්න. (ල.04)

iii. රසායනික ද්‍රව්‍ය මඟින් සිදුවන අනතුරු වළක්වා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

6)

i. නායකයෙකු සතුවිය යුතු ගුණාංග 03ක් ලියන්න. (ල.03)

ii. ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලියට අදාල ගුණාංග 02ක් ලියන්න. (ල.04)

iii. සමාජයට නායකයන් අවශ්‍ය වන්නේ ඇයි? කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

7)

i. අනතුරු හා ආපදාවලදී සහය ලබාගත හැකි ආයතන 03ක් ලියන්න. (ල.03)

ii. නිවස ආශ්‍රිතව සිදුවිය හැකි අනතුරු 02ක් ලියන්න. (ල.04)

iii. අනතුරක් සිදුවූ අවස්ථාවකදී සිදුවිය හැකි හානි තවදුරටත් අවස කරගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග කෙටියෙන් විස්තර කරන්න. (ල.05)